# මූලමාධ්‍යමිකකාරිකාව දෘෂ්ටිවාද බැහැර කරන්නේ මුල් බුදුසමය අනුව යමින්ද?

ජී. නිමේෂ් නිරංජන්[1]

## හැඳින්වීම

මාධ්‍යමික දර්ශනයේ කේන්ද්‍රීය ග්‍රන්ථය වූ නාගාර්ජුනපාදයන්ගේ මූලමාධ්‍යමික කාරිකාවෙහි පැනෙන, දෘෂ්ටි ප්‍රහාණය පිළිබඳ අදහස් මුල්බුදුසමය තුළ පැනෙන දෘෂ්ටි ප්‍රහාණය පිළිබඳ අදහස්වලින් කෙසේ වෙනස් වේද යන්න සාකච්ඡා කිරීම මෙහි මූලික අරමුණයි.

## ක්‍රමවේද සහ ක්‍රියාපටිපාටිය

මාධ්‍යමික දර්ශනය, දෘෂ්ටිවාද පිළිබඳ මුල් බුදුසමයේ ආකල්පය, මූලමාධ්‍යමිකකාරිකාව ආදී අංශ පිළිබඳව තත් ක්ෂේත්‍රීයව ඇති මතයන්, පොතපත හා ලිපි පරිශීලනය කිරීමෙන් තුලනාත්මක හා විශ්ලේෂණාත්මක ප්‍රවේශ භාවිත කරමින් දාර්ශනික විමර්ෂණයක් සිදු කිරීම මෙහිදී සිදුව තිබේ.

## පර්යේෂණ ප්‍රතිඵල සහ සාකච්ඡා

බුද්ධ පරිනිර්වාණයෙන් පසු නිකායාන්තරව බුදු දහම බෙදී ගිය අතර එම මත තනි තනි සම්ප්‍රදායන් ලෙස ප්‍රචලිත විය. කණිෂ්ක රාජ්‍ය සමයේ සිදු වූ ධර්ම සංගායනාවෙන් පසුව චතුර්විධ බෞද්ධ සම්ප්‍රදායයන් ඇරඹීම සිදු වීමද උක්ත තත්ත්වය ප්‍රකට කරයි. මාධ්‍යමික සම්ප්‍රදාය මේ අතරින්ද සුවිශේෂ තැනක් හිමි කර ගනී. සියලුම ආකාරයේ අන්තගාමී ප්‍රතිපදා බැහැර කර මධ්‍යම ප්‍රතිපදාවක පිහිටා සිය සිද්ධාන්ත ඉදිරිපත් කරන සම්ප්‍රදායක් ලෙසින් මාධ්‍යමිකයෝම තමා හඳුන්වාගත්හ.

මේ ගමන් මඟම ගත් මූලමාධ්‍යමිකකාරිකාවද අන්තගාමී දෘෂ්ටි ප්‍රහාණයට නැඹුරුව තිබේ. විද්වත් මතය වන්නේඑය විසිහත් වන පරිච්ඡේදය තුළ දක්නට ලැබෙන බවයි. නමුත් මේ කෘතිය තුළ අන්‍ය පරිච්ඡේදයන්හි පැනෙන ප්‍රතීත්‍ය සමුප්පාදය,ශූන්‍යතාවාදය, අනිත්‍ය ලක්ෂණය ඔප්නැංවීම ආදී අනු කරුණු සියල්ලමත් විසිහත්වන පරිච්ඡේදයේ දෘෂ්ටි ප්‍රහාණයටම මඟ විවර කර දෙන බැවින් මේ කෘතියේ ප්‍රධාන අරමුණ දෘෂ්ටි ප්‍රහාණය බව පැහැදිලි වේ.

---

[1] දර්ශන අධ්‍යනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, nimeshniranjan3@gmail.com

බොහෝ උගතුන්ට අනුව මේ කෘතිය මහායානික ආභාසය ඇත්තකි. නමුත් මෙය මුල් බුදු සමයෙන් ලද ආභාසයේ ප්‍රතිමූර්තියක් බවපිළිගැනීමට විද්වතුන් මැළි වන්නේ මූලමාධ්‍යමිකකාරිකාව තුළ ශූන්‍යතාවාදය පැහැදිලි කිරීමට වැඩි ඉඩකඩක් වෙන් කර තිබෙන නිසාත්, ශූන්‍යතා සංකල්පය මහායානිකයන් අතින් අධි ජනප්‍රියත්වයට පත් වූවක් නිසා මෙයද ඒ තත්ත්වයේ සලකන නිසාත් විය යුතුය. නමුත් ශූන්‍යතාවාදය දුටු සැණෙකින් එය මහායානික යැයි සැලකීම නිවැරදි නොවන්නේ එය මුල්බුදුසමය තුළද කතා බහට ලක්ව ඇති බැවිණි.

''මහා සුඤ්ඤත'' සූත්‍රයේ දී සියලු ආකාරයේ අරමුණු මෙනෙහි නොකිරීමෙන් සියල්ල එතැනම අවසන් කිරිමෙන් ශූන්‍යතාව සම්පාදනය කළ හැකි බව කියා තිබීම හා මජ්ඣිම නිකායේ ''පිණ්ඩපාත පාරිසුද්ධ'' සූත්‍රයේදී සැරියුත් හිමි ශූන්‍යතාව මෙනෙහි කළ බව අසා බුදුහිමි සාධුකාර දුන් බව දක්වා තිබීම ආදිය මුල්බුදුසමයද ශූන්‍යතාව අනුමත කළ බවට උදාහරණ සපයයි. මේ පිළිබඳ ගැඹුරු විවරණයක යෙදුණු බෙල්ලන්විල විමලරතන හිමියන් සියල්ල ශූන්‍යවන්නේ අනිත්‍ය නිසා බවත් ශූන්‍යතාව අනිත්‍ය සංකල්පයේම වර්ධිතයක් බවත් පෙන්වා දුන්හ.

මුල් බුදු දහමේ පැනෙන පටිච්ච සමුප්පාද සිද්ධාන්තය මඟින් සයංකතවාදය, පරංකත වාදය, සයංකත පරංකතවාදය හා අසයංකාර අපරංකාර අධිච්චසමුප්පන්නවාදය යන චතුර්විධ දෘෂ්ටීන් බැහැර කෙරේ. විශේෂයෙන්ම ''නලකලාප'' වැනි සූත්‍රවල දේශනා කර ඇත්තේ සාපේක්ෂතාවාදී ප්‍රතිත්‍ය සමුප්පාදයකි. නාගර්ජුනපාදයන්ද මූලමාධ්‍යමික කාරිකාවේ පළමු පරිච්ඡේදයමප්‍රත්‍ය පරික්ෂාවට වෙන් කර ඇත. මේ කෘතිය තුළ පටිච්ච සමුප්පාදය ශූන්‍යතාව යන අරුතින්ම යෙදී තිබීම සුවිශේෂි වූවකි. ලොව ඇත්තේ සාපේක්ෂක දේ මිස නියතයන් නොවන බව කීමෙන් දෘෂ්ටි ප්‍රහාණයට අවශ්‍ය පදනම සපයාගෙන ඇත. හේතුව ඵලය අපේකෂා කරන බවත් ඵලය හේතුව අපේක්ෂා කරන බවත් මින් වැඩි දුරටත් කියැවේ. මෙසේ දෘෂ්ටි ප්‍රහාණයට අනුබල දෙමින් සාපේක්ෂක පටිච්ච සමුප්පාදී ධර්මතාවක් ඉදිරිපත් කරන මූලමාධ්‍යමිකකාරිකාව, මුල්බුදුසමයට වඩාත් සමීපවන්නක් බව මෙමඟින් පැහැදිලි වේ.

''ශූන්‍යතා සර්ව දෘෂ්ටිනාංප්‍රොක්තානිශ්ශරණං පීනෛඃ යෙශාංතු ශූන්‍යතා දෘෂ්ටිඃ තානසාධ්‍යාන් බභාෂිරේ''

ශූන්‍යතාව යනු දෘෂ්ටින්ගෙන් මිදීම බව බුදුවරු කියන ලද බවත් යමෙකු ශූන්‍යතාවද දෘෂ්ටියක් කර ගත් විට එය සුවකළ නොහැක්කක් බවද මාධ්‍යමිකකාරිකාව පෙන්වා දෙයි. මේ අදහසට සමාන අදහසක් අලගද්දූම සූත්‍රයේදී දැකගත හැකිය. එහිදී,

"කුල්ලූපමං වෝ, භික්ඛවේ, ධම්මං දේසිස්සාමි. නිත්ථරණත්ථාය, නොගහනත්ථාය, යනුවෙන් සඳහන් වේ.", "ධර්මය පහුරක් වැනිය. එය නිවනින් එතෙර වීමට මිස කරතබාගෙන යාමට නොවේ" යන්නයි. මෙහිදී ද ධර්මය දෘෂ්ටියක් කර ගැනීමේ අයහපතම විස්තර කර තිබේ.

මෝඝරාජ සූත්‍රයේදී ද යෝනිසෝ මනසිකාරයෙන් යුතුව, ලෝකය ශූන්‍ය බව ප්‍රඥාවෙන් අවබෝධ කරගත යුතු බව දක්වා ඇත. මෙය සම්පූර්ණයෙන්ම මූලමාධ්‍යමිකකාරිකාවට එකඟය. මන්ද, ඒ තුළින් ශූන්‍යතාව පරමාර්ථය කරගත් ලොවකදෘෂ්ටීන්හි වැදගත්කමක් තිබේද යන්න ගැන සාකච්ඡා වී ඇති නිසාය.

මජ්ඣිම නිකායේ මූල පරියාය හා සබ්බාසව යන සූත්‍රවලඅයෝනිසෝ මනසිකාරය නිසා කාමාසව,භවාසව, දිට්ඨාසව, අවිජ්ජාසව ආදිය පෘථග්ජනයන් වෙත පහළ වන බව දක්වා තිබේ. මේ තත්ත්වයද මූලමාධ්‍යමිකකාරිකාව හා සම්පූර්ණයෙන්මඑකඟය.

දෘෂ්ටි පිළිබඳව කරන සාකච්ඡාවේදී අමතක කළ නොහැකි සූත්‍රය ''බ්‍රහ්මජාල'' සූත්‍රයයි. එහිදී, දෙසැටක් මිථ්‍යාදෘෂ්ටීන් ගැන සඳහන්ය. ආත්මය සහ ලෝකය මත දෘෂ්ටි උපත ලබන බව කීම මූලමාධ්‍යමික කාරිකාවේ අදහසට සමාන බැව් පෙනේ. මූලමාධ්‍යමිකකාරිකාවේ විසිහත්වන පරිච්ඡේදයේ දී පළමු ගාථාවේ සිට විසිඑක්වන ගාථාව තෙක් පැහැදිලි කර ඇත්තේ ආත්මය පිළිබඳ දෘෂ්ටීන් ගැනයි.

අනතුරුව ලෝකය පිළිබඳව වන දෘෂ්ටි සාකච්ඡා කර ඇත. නමුත් බ්‍රහ්මජාල සූත්‍රයේදී සාකච්ඡා වන දෘෂ්ටිවාද හැට දෙකම මූලමාධ්‍යමිකකාරිකාවේදී සාකච්ඡා කර නැත. එහිදී සාකච්ඡාවට ගෙන ඇත්තේ සාස්වතවාද, උච්ඡේදවාද, අනන්තානන්තිකවාද,සඤ්ඤවාද ආදී කිහිපයක් ගැන පමණි. බ්‍රහ්මජාල සූත්‍රයේදී නැවත උක්තවාද දෙසැට, සාස්වතවාද 50 ක් හා උච්ඡේදවාද 12 ක් ලෙස ද්විප්‍රකාරව බෙදා දැක්වේ. මේවායින් අතීත භවයන් අපේක්ෂා කරන දෘෂ්ටි 18 පූර්වාන්ත කල්පික ලෙසත් අනාගත භවයන් අපේකෂා කරන ඉතිරි භවයන් 44 අපරාන්ත කල්පික ලෙසත් පැහැදිලි කරන අදහස මූලමාධ්‍යමිකකාරිකාවේද දැක්වේ. මුලමාධ්‍යමිකකාරිකාවේ 1 සිට 4 දක්වා වන ගාථාවලින් ආත්මය අතීත හා අනාගත ලෙස ගැනීම වැරදි සහගත බව දැක්වේ. 15 සිට 20 දක්වා ගාථාවලින් ලෝකය පිළිබඳව වන ශාස්වත හා උච්ඡේදවාදී දෘෂ්ටි පැහැදිලි කර තිබේ. 21 සිට 28 දක්වා ලෝකයේ අන්තවත් හා අනන්තවත් බව පහදා තිබේ. සූත්ත නිපාතයේදී ආත්ම දෘෂ්ටිය ප්‍රතික්ෂේප කිරීමට උත්සහ කළ එහි එන ''පුරාභේද'' සූත්‍රය හා ''උ෧පසීහමානපුච්චාව'' සූත්‍රය මූලමාධ්‍යමිකකාරිකාව හා මනාව ගැලපෙයි. නිවනට යන පුද්ගලයා කෙලෙස් වලින් වෙන්ව ආත්ම දෘෂ්ටි ක්ෂය කරන බව පවසා නිවන

යනු දෘෂ්ටි රහිත තැනක් බව එම සූත්‍රාගත කරුණු පැහැදිලි කරයි. මූල මාධ්‍යමිකකාරිකාවේ  අවසාන අපේක්ෂාවත් මෙයම නොවිය හැකිද? යන පැනය මෙහිදී අපට මතු වේ.

සුත්ත නිපාතයේ අට්ඨක වග්ගයේ එන සූත්‍රාගත කරුණු ද මෙහිදී විමසා බැලීම වටින්නේ උගතුන් මුල් බුදුසමයට අයත් සූත්‍රලෙස අවිවාදීව ඒවා පිළිගන්නා බැවිණි. සුද්දට්ඨක සූත්‍රයේ දී,"දැකීමෙන් පිරිසිදු බව ලැබේ යැයි" සිතා එය ඥානමාර්ගයක් කර ගන්නා බව පවසා තිබේ. දිට්ඨමංගලික, සුත මංගලික ආදීන් ගැන මහාමංගල සූත්‍රයේ නිධානකතාව පිරික්සන විට අපට හමුවේ. මෙහිදී මේ ඇසූ දුටු දේ මංගල යැයි කියවෙන දෘෂ්ටි ප්‍රහාණය කර ඇත. පරමට්ඨක සූත්‍රයේදී තම දෘෂ්ටිය ශ්‍රේෂ්ඨ බවත් අන්‍ය දෘෂ්ටින් පහත් බවත් සිතීම වැරදි සහගත යැයි පෙන්වා දී ඇත. ''පසූර'' සූත්‍රයේදී "පසූර" නම් වාදකරුහට තම ශාස්තෘවරයා උසස් යැයි කියා, තම දෘෂ්ටිය නිවැරදි යැයි කියා වාද කර ජය ගත හොත් සතුටු වන්නා සේම, පරාජය වුවහොත් දරාගත නොහී කිපෙන බව පහදා දෘෂ්ටීන්හි අයහපත දක්වා ඇත. ''මාගන්ධිය'' හා ''චූලවියූහ'' සූත්‍ර තුළදෘෂ්ටි ගතිකත්වයන් විවේචනය කර තිබේ.

දෘෂ්ටි ප්‍රහාරණය සමඟ කතා කළ යුතු අනෙක් කරුණු වන්නේ දෘෂ්ටි ප්‍රහාණයෙන් නැවත ගොඩ නැගූ සම්‍යක්දෘෂ්ටිය කුමක්ද යන්නයි. මුල්බුදුසමයේ ඇති විශේෂත්වය වන්නේ "කිසිදු දෘෂ්ටියක් අල්වා නොගත යුතු බව කීමයි. හෙවත් දෘෂ්ටි ප්‍රහාණයෙන් පසු එම ධර්ය පවා නැවත දෘෂ්ටියක් නොකොට ගත යුතු බව කීමයි.. එය උක්තව අලගද්දූපම සූත්‍රය අරභයා විස්තර කර ඇත. "යදි කශ්චන ප්‍රතිඥා සත්‍යාත්- මෙ තත එෂ මෙ භවේද්දෝෂං නාස්තිංච මෙ ප්‍රතිඥා- තන්මාන් නෛවාස්ති" යැයි "විග්‍රහව්‍යාවර්තනියේදී "නාගාර්ජුනපාදයන් කියයි.එනම්''ඉදින් මා හට තහවුරු කළ යුතු යමක් වේ නම් එය මාගේ වරදකි. එබඳු මතයක් මා හට නැති බැවින් එහිවරදක්ද නැත.'' යනුවෙනි.

**නිගමනය**

ප්‍රණාම ගාථාවෙන් නිරෝධය හා උප්පාදය නැති උච්ඡේදවාදී හා ශාස්වතවාදී නොවන භින්නාර්ථ හා අභින්නාර්ථ නොවන ආගම හා නිර්ගම නැති දෘෂ්ටි සමහන් කරන (ප්‍රපඤ්චෝපශමං ශිවං) ප්‍රතීත්‍ය සමුප්පාදය හඳුන්වා දුන් බුදු හිමිට නමස්කාර කරමින් මූලමාධ්‍යමිකකාරිකාව අරඹයි.මෙම කෘතිය අවසාන වන්නේ ද සියලු දෘෂ්ටි ප්‍රහාණය කළඋන්වහන්සේට නැවත නමස්කාර කරමිනි. අසංග තිලකරත්නයන්ගේ මතය වන්නේද මූලමාධ්‍යමිකකාරිකාව තුළ කිසිදු මහායානික මූලාශ්‍රයක් නොමැති නිසාත් එකම මූලාශ්‍රය ලෙස සඳහන් කරන්නේ

''කච්චායනගොත්ත'' සූත්‍රය වන නිසාත්, මෙය මුල්බුදුසමයෙන් ලද ආභාසයම පෙන්නුම් කරන බවයි. උක්තව සඳහන් කළ සියළු උදාහරණද තත් මතයම සාධනය කිරීම සඳහා ඉවහල් වනු ඇතැයි සිතමු. එනම් දෘෂ්ටිවාද ප්‍රහාණයේදී මූලමාධ්‍යමිකකාරිකාව මුල්බුදුසමයට එකඟ බව පෙනෙනු ඇත. නමුත් මුල්බුදුසමය තුළ දෘෂ්ටිප්‍රහානය සඳහා තර්කය භාවිත කිරීමක් සිදුව නැතත් මූලමාධ්‍යමිකකාරිකාව තුළ බෞද්ධ චතුස්කෝටිය භාවිත කරමින් එය තර්කාණුකූලව සිදුකළ අයුරු දැකගත හැකිය.

ප්‍රමුඛ පද : දෘෂ්ටිවාද, ශූන්‍යතාවාදය, මාධ්‍යමික දර්ශනය, මුල්බුදුසමය

### ආශ්‍රිත ග්‍රන්ථ

අංගුත්තර නිකාය I. (2006)දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

දීඝ නිකාය I. (2006). දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

මජ්ඣිම නිකාය I. (2006). දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

මූලමාධ්‍යමිකකාරිකාව: ශූන්‍යතාවාදී දර්ශනය හා චරණය. (2010).(පරි.) අසංග තිලකරත්න. හෝමාගම: සීමාසහිත කරුණාරත්න සහ පුත්‍රයෝ.